# ක්‍රි. පූ 6වන සියවසේ භාරතීය විශ්‍රාන්තිය

ආර්. ජේ. ඩබ්. ජයසේන

"සිත්හි හට ගනිමින් සිත ගිලන්කරන අගෝචර මනෝභාවයන් යටපත්කොට භාවනාව චිත්තඒකාග්‍රතාවය ඇති කරයි. සිත පැහැපත් වන්නට වන්නට සිත්හි නිර්මාණ චින්තනය පහළ වේ. ස්වාධීන පරිකල්පනය පහළ වේ. රසාලිප්ත සන්නිවේදනය පහළ වේ." යනුවෙන් බෞද්ධ දර්ශනය පිළිබඳව පෙරවදනේ සටහන් තබමින් තරංග සමරවික්‍රම මහතා විසින් 2010 වසරේ"සල්මල සුවඳමය"කෘතිය රචනාකොට තිබේ. ක්‍රි. පූ. 6වන සියවසේ භාරතීය සමාජයේ විශ්‍රාන්ති අඩු වැඩි වශයෙන් නූතන ලාංකීය සමාජයේද දක්නට ලැබේ. පිටු 164 පුරාවට ගෞතම බුදුන් පහළවන අවධියේ භාරතයේ ශාක්‍යය, කෝලීය වංශිකයන්ගේ විශ්‍රාන්ති ආශ්‍රිතව රචිත ග්‍රන්ථයක් ලෙසට මෙම ග්‍රන්ථය හඳුනාගත හැකිය.

ප්‍රණීත ආහාරපාන ඇති තරම් දනට දී සිත සතුටු කරගත් මහමායා උද්‍යානයේ සඳුන් පොකුණට බැස ස්නානය කළාය... මහමායා මසකටත් වැඩි කාලයක් රක්‍ෂාකළ ව්‍රතය අවසන් කිරීමෙන් දුගී මගී යාචකාදීන්ට දන් දීමෙන් මහත් සොම්නසක් ලැබුවාය... ඊ සියෙතුන්ගේ මට සිළිටු ගීතිකා, භාග්‍යරතී නදියට වැටී දීප්තිමත්ව බබලන සඳ එළිය, සුද්ධෝදනගේ සිත අමන්දානන්දයට පත් කළේ ය... සුද්ධෝදන මෙවර පූර්ණිමා දිනය උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට තීරණය කළේ මේ චිත්ත ප්‍රබෝදය නිසාවෙනි... භාග්‍යරතී ගං ඉවුරේ සාල ගසක් අසලින් වාඩිගත් සුද්ධෝදන ඇඟිලි තුඩුවලින් මානෙල් පොහොට්ටුව විකසිත කළේය. මානෙල් මලෙහි පෙති එකින් එක ඇඟිලි තුඩින් විකසිත කරමින් මෙතෙක් ජීවිතයේ පසුකළ විවිධ අවස්ථා අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කරමින් අතීතාවලෝකනයක යෙදුණි... "අර ඈතින් දීප්තිමත්ව බබළන තනි තාරකාවට මම ඇලුම්කරමි. අහසේ පායන පුරහඳට මම ඇලුම්කරමි. මුළු කිඹුල්වතම සඳ වතුරෙන් දෝර ගලා යන හැටි දකින්නට ඇලුම් කරමි. බලන්න සිතට මොනතරම් සැනසිල්ලක් මේ පරිසරයෙන් ලැබෙන්නේද?"සුද්ධෝදන රජු ප්‍රකාශ කළේය.

"දාසිය අපර්ණා බලන්න අපි ගමන් කරන පරිසරය කොතරම් චමත්කාරද? මට මගේ බාල විය නිතැතින්ම මතකයට එන්නේය. මම බාල වියේ ගෝතමිය ත් මම ත් වසුන්දරා ත් මේ වැනි උද්‍යාන වල කොතරම් කෙළි සෙල්ලම් කර ඇද්ද?"යනුවෙන් මහමායා දේවිය ප්‍රකාශ කළාය. අශ්ව රථයෙන් බැස සඳුන් දෝලාවට ගොඩ වූ මහාමායා සේවකයින් විසින් ඔසවා සාල උද්‍යානයට රැගෙන යන අතර මෘදංග වාදකයෝ විලම්බිතාලයකින් ලයාන්විත වාදනයක් වැයූහ. ඊට උචිත සේ වස්දඬු හා බන්සූර් වාදකයෝ නාද සංයෝජනය කළෝ ය... සතුටින් පිරී ඉතිරී ගිය සුද්ධෝදන සත් සින්නම් පසඟ තුරු වීණා මෘදංග හා නාද ස්වරම් සමඟින් අලංකාර පෙරහැරක් ලුම්බිණි සල් උයන දක්වා යැවී ය... මන්දිරයේ තැනින් තැන ඉදිකර ඇති මණ්ඩපවල ගාන්ධර්වයෝ ය, නාටිකාංගනාවෝ ය, ගැයුම් වැයුම් නැටුම් වලින් කපිලවස්තුව පිරී ගොස් ය... සත්සියයක් වූ පිරිවර සමඟින් සුද්ධෝදන නැකත් හෝරාවක් අනුව කෙතට බැස්සේ බුම්මැඩි, උඩැක්කි, මෘදංග හා සක් සින්නම් නාදය ද සමඟිනි...

තදින්ම දෑස් පියාගත් සිද්ධාර්ථ භාවනායෝගී ව කරුණාව, මෛත්‍රිය වැඩී ය. හුස්ම ගන්නා ආකාරයත් හුස්ම පිටකරන ආකාරයත් නාස්පුඩු අතරින් ගන්නා හුස්ම නාසයට ඇතුළු වීමේදී ත් පිට වීමේදී ත් නාස්පුඩුවලට දැනෙන ස්පර්ශය ත් සිතින් මෙනෙහි කරන්නට විය... විවේකී වූ සෑම විට ම මන්දිර පරිශ්‍රයට ඈතින් දිස්වෙන කෙත්වතු අඹ, දෙළුම්, දොඩම් ගස්, සාල හා කොබෝනීල මෙන් ම කීන වැල් වලින් පිරි පරිසරයට යන සිද්ධාර්ථ හමා එන සුළඟේ රිද්මයට සවන් දෙන්නේ සමාධියෙනි, ආදරයෙනි, ඕනෑකමිනි...කෙත්යායේ ඉපනැල්ලට උඩින් කිසියම් රිද්මයකට මියුරු ස්වරයක් ඇති කරමින් හමා ආ සිහිල් මඳ පවන සුවය ගෙනදෙන්නක් විය. සුළඟේ රිද්මයට සංසුන්ව පියවර තැබූ සිද්ධාර්ථ අඹ රුක් සෙවනේ නතර විය...

"සල්මල සුවඳමය " කෘතිය ක්‍රි. පූ. 6වන සියවසේ භාරතයේ නොයෙක් විශ්‍රාන්ති චර්යාවන් සොයා යන්නෙකුට අත්පොතක් කරගත හැකිය.

සමරවික්‍රම තරංග (2010) සල්මල සුවඳමය, (පළමු මුද්‍රණය), කර්තෘ ප්‍රකාශන, මියැසි අසපුව, කුළුපන, හොරණ.